

මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා

# මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු

මහාචාර්ය හර්සන් ඝයස්

වර්ෂ 1943 අප්‍රේල් මස 05 දින උපත ලද චන්ද්‍රසිරි පල්ලියගුරු කුඩාවියේ දී ජීවිතය හා සමාජය පිළිබඳ ව උගත්පත් ගමත් නගරයත් එකසේ ඇසුරු කරමිනි. මූලික හා ද්විතීයික අධ්‍යාපනය මාතර රෝහණ මහා විද්‍යාලයෙන් ලැබූ එතුමා 1961 වර්ෂයේ දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට ඇතුළු වූයේය. එහිදී ප්‍රථම වර්ෂ පරීක්ෂණය සඳහා සිංහල, පාලි හා හින්දි භාෂා හදාරා අනතුරුව විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා සිංහලත් අනුවිෂය වශයෙන් හින්දි භාෂාවත් තෝරා ගෙන අධ්‍යයන කටයුතුවල නිරත වූයේය. 1965 වර්ෂයේ දී ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය උසස් ලෙස සම්මත විය.

1965 සිට 1967 දක්වා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේත්, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේත් හින්දි භාෂාව පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් එතුමා සේවය කළේ ය. ඉන් අනතුරුව 1967 වර්ෂයේ දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ස්ථිර ආචාර්යවරයකු වශයෙන් සේවයට බැඳී 1970 වර්ෂයේ දී පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මහා බ්‍රිතාන්‍යයේ ලැන්කැස්ටර් විශ්වවිද්‍යාලයට ඇතුළු වූයේය. එහිදී සංස්කෘතික මානව විද්‍යාව හදාරා "මාතර දිස්ත්‍රික්කය පිළිබඳ විශේෂ අවධානයකින් ලංකාවේ වත්පිළිවෙත් හා සම්බන්ධ යෝජිත වර්ගීකරණයක්" යන මැයෙන් යුතු ආචාර්ය උපාධි නිබන්ධය සඳහා ලංකා විශ්වවිද්‍යාලයෙන් දර්ශන විශාරද උපාධිය හිමි කර ගත්තේ ය. අනතුරුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට පත් වූ එතුමා 1985 සිට 1989 දක්වා සිංහල අධ්‍යයන අංශයේ අංශාධිපති තනතුර මෙන් ම ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ වැඩ බලන අංශාධිපති තනතුර හොබවමින් එම අංශවල අභිවෘද්ධිය වෙනුවෙන් මහත් සේවාවක් සිදු කළේ ය. 1988/89 අධ්‍යයන වර්ෂය සඳහා චීනයේ බෙයිජිං විදේශීය භාෂා විශ්වවිද්‍යාලයේ ආරාධිත මහාචාර්යවරයකු වශයෙන් කටයුතු කළේ ය. විශ්වවිද්‍යාල පරිපාලන ක්ෂේත්‍රයට එතුමන්ගේ ප්‍රශස්ත දායකත්වය සැලසෙන්නේ 1995 - 2001 දක්වා කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් පත්වීමත් සමඟ ය. සිංහල